

photo: Trey McIntyre Project by US Consulate Guangzhou

# ඇමෙරිකානු බැලට් පිළිබඳ කෙටි ඉතිහාසයක්

සුසාන් යුන්ග්

2013

# ඩාන්ස්මෝෂන් යූඑස්ඒ පිළිබඳ සටහනක්

ඇමරිකානු නාට්‍ය පිළිබඳ තොරතුරු ගෝලීය ජනතාවට ලබාදීම සඳහා මෙම නිබන්ධනය ඩාන්ස්මෝෂන් යූඑස්ඒ විසින් නිෂ්පාදනය කරන ලදී. ඩාන්ස්මෝෂන් යූඑස්ඒ යනු ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යාපනික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ කාර්යාංශයේ වැඩසටහනක් වන අතර සංගීතය පිළිබඳ බෲක්ලින් ඇකඩමිය (Brooklyn Academy of Music) විසින් අන්‍යොන්‍ය අවබෝධය සඳහා පහසුකම් ඇති කරමින් සමකාලීන උසස් ඇමරිකානු නාට්‍ය විදේශයන්හි පෙන්වීම සඳහා නිෂ්පාදනය කරන ලද්දකි. ඩාන්ස්මෝෂන් යූඑස්ඒ විසින් ප්‍රධාන සංස්කෘතික, සමාජ සේවා සහ ප්‍රජා මූලික ආයතනයන් සහ අධ්‍යාපනික ආයතනයන් සමඟින් හුවමාරුව සහ බැඳීම සඳහා ඉඩදෙනු ලබන අසමසම නවාතැනක් නිර්මාණය කිරීම සඳහා ඇමරිකානු තානාපති කාර්යාල හවුල්කරුවන්ට උදව් ලබා දේ. එයට අමතරව, පුද්ගලයාගෙන් පුද්ගලයාට මැදිහත්වීම තුළින්, ක්‍රියාශීලී සමාජීය සහ ඩිජිටල් මාධ්‍ය මුල්පිරීම් තුළින් සහ තානාපති කාර්යාල සහ කොන්සල් කාර්යාලවල පුස්තකාල මඟින් මෙම වැඩසටහන පුළුල් පර්යේෂක පිරිසක් කරා ළඟාකර ගනී.

**කරුණාකර අපගේ dancemotionusa.org වෙබ් අඩවිය බලන්න**

# කර්තෘ පිළිබඳ වදනක්

සූසාන් යන්ග්

සංගීතය පිළිබඳ බෘක්ලින් ඇකඩමියේ ප්‍රකාශන කළමනාකාරවරිය වන සූසාන් යන්ග් විසින් වැඩසටහන්, සංස්කාරක අන්තර්ගත සහ විවිධ ව්‍යාපෘතීන් නිෂ්පාදනය කර සංස්කරණය කරන අතර BAM Blog. වෙත දායක වේ. ඇය විසින් ආයතනයට වසර 150ක් පිරීම නිමිත්තෙන් එහි සැමරුම් පොත වන BAM: නිමකළ කාර්යය කෘතියේ සමකතෘවරිය වූ අතර පිනා බෝෂ් සහ බිල් ටී (Pina Bausch and Bill T) ඇතුළත්ව ප්‍රවීන කලාකරුවන් පිළිබඳ රචනා බොහෝමයකට දායක විය. නාට්‍ය සහ දෘෂ්‍ය කලාවන් පිළිබඳ අවධානයක් ඇති නිදහස් ලේඛකයෙක් ලෙස, ඇය Ephemeralist.com වෙබ් අඩවියෙන් තොරතුරු දක්වන අතර විවිධ ප්‍රකාශනයන්ට සහ *Dance Magazine*, WNET's Sunday Arts blog, Pointe, Village Voice, Ballet- Tanz (Berlin), Brooklyn Rail, සහ වෙනත් වෙබ් අඩවි ඇතුළත් වෙබ් අඩවිවලට දායක වී ඇත. සූසාන් යන්ග් වසර අටක කාලයක් බැසී ත්‍යාග කමිටුවේ සේවය කළ අතර බොහෝ සංස්කෘතික දීමනා සහ ත්‍යාග ලබාදෙන සංවිධානයන්ට උපදෙස් ලබා දී ඇත.

# ඇමරිකානු මුද්‍රා නාට්‍යයෙහි ලුහුඬු ඉතිහාසය

ඇමරිකානු මුද්‍රා නාට්‍යයෙහි ලුහුඬු ඉතිහාසය

අමරිකානු මුද්‍රා නාට්‍ය රුසියාවේ සහ යුරෝපයෙන් ද, මූලිකව ප්‍රංශයෙන් සහ එංගලන්තයෙන් ද මූලාරම්භ වූවකි. ඉතා අත්‍යවශ්‍ය මෙන්ම ඉතා වැදගත්ව පවත්නා මුල් කාලීන ප්‍රධාන සමාගම් අතරට ලුසියා චේස් සහ ඔලිවර් ස්මිත් විසින් 1939 දී ආරම්භ කරන ලද අමරිකන් බැලට් තියටර් (American Ballet Theatre), සිටිස් ඔපෙරා සමාගමෙන් වෙන්වී යාමෙන් අනතුරුව විලියම් ක්‍රිස්ටෙන්සන් යටතේ 1942 දී ස්වීය හිමිකාරත්වයට පත්වූ සැන් ප්‍රැන්සිස්කෝ බැලට් (San Francisco Ballet) සහ ලින්ක්ලන් කර්ස්ටින් සහ ජෝර්ජ් බැලන්චින් විසින් නිල මට්ටමින් ආරම්භ කරන ලද නිව්යෝක් සිටි බැලට් (New York City Ballet) ආයතන ඇතුලත් වේ. පසුගිය අර්ධ ශතකය තුළ ඇමෙරිකාවේ සැලකියයුතු මුද්‍රා නාට්‍ය කණ්ඩායම් බොහෝමයක් මෙම සංවිධානය හරහා ඉවත්ව ගිය නර්තන රචකයින් සහ නර්තකයින් විසින් ආරම්භ කරන ලද ඒවාය.

ජෝර්ජ් බැලන්චීන් සහ නිව්යෝක් සිටි බැලට් (GEORGE BALANCHINE AND NEW YORK CITY BALLET)

අමරිකානු මුද්‍රානාට්‍යයෙහි අසහාය මෙන්ම වඩාත් වැදගත් තැනැත්තා වශයෙන් රුසියාවේ උපන් බැලන්චින් (Balanchine) (1904 – 1983) හැඳින්විය හැකිය. තරුණ ගැටවරයෙක් ලෙස මුද්‍රානාට්‍ය සමඟ පියානෝ වාදනය උගත් ඔහු ස්වකීය තරුණ අවධියේදීම නාට්‍ය රචනය ආරම්භ කරන ලදි. 1921 වසරේදී ඔහු මැරින්ස්කි බැලට් (Mariinsky Ballet) සඳහා සම්බන්ධ වූ අතර ඔහු 1924 දී රුසියාව හැර දා ගොස්, අනිකුත් ස්ථානයන් අතරින් තමා විසින් නාට්‍ය රචනයේ යෙදුනු පැරිසියේ බැලට්ස් රසස් සමඟින් සම්බන්ධ විය. 1920 – 30 කාල සීමාව ඇතුළත, ඔහු විසින් මුද්‍රානාට්‍යයන් කිහිපයක් නිර්මාණය කරන ලද අතර, අදටත් නිව්යෝක් සිටි බැලට් ප්‍රසාංගික එකතුවෙහි පවතින ඇපලෝ ඇන්ඩ් සෙරනේඩ් (Apollo and serenade) නාටකය ද ඇතුලත්ව ඒවා ඔහුගේ අලංකාරතම නිර්මාණ අතර රඳා පවතී. 1933 දී නාට්‍ය අධ්‍යක්ෂ ලින්කලන් කර්ස්ටියන් ඇමරිකන් මුද්‍රානාට්‍ය පාසල (ස්කූල් ඔෆ් ඇමරිකන් බැලට්) ආරම්භකිරීම පිණිස ඔහුව නිව්යෝර්ක් වෙත යාමට පොළඹවාගත් ගැනීමෙන් අනතුරුව ඔහු එහිදී නර්තකයින් පුහුණු කළ අතර, අවසානයේදි සමාගම එම පුහුණු නර්තකයන්ගෙන් සමන්විත වනු ඇත. ඔහු මෙට්රොපොලිටන් ඔපෙරා, පැරිස් ඔපෙරා බැලට්, බැලට්ස් රුසස්, බ්‍රෝඩ්වේ සහ හොලිවුඩ් චිත්‍රපට වල නාට්‍ය රචකයෙක් ලෙස සහ/හෝ මුද්‍රානාට්‍ය විශාරදකයෙක් ලෙස කටයුතු කලේය. නිව්යෝක් සිටි බැලට්, එහි වර්තමාන නිවහන වන ලින්ක්ලන් මධ්‍යස්ථානයේ කෝච් රඟහල වෙත 1964 වසරේදී ගෙනයන තුරු නිව් යෝර්ක් සිටි බැලට් (New York City Ballet) නිව්යෝර්ක් සිටි සෙන්ටර්හි පිහිටා තිබුණි. එහි මූලික ප්‍රසාංගික එකතුව බැලන්චීන් භාරය (Balanchine Trust) විසින් අධීක්ෂණය කරනු ලබන බැලන්චින්ගේ කාතීන් සමස්තය තුළ පවතී.

නූතනවාදී සහ වස්තුපාදක නොවන මුද්‍රානාටක සඳහා ඓතිහාසික තිහාසික මං තනන අතරතුර, මිත්‍යාවන් හෝ වෘත්තාන්තයන් මත පදනම්ව බැලන්චීන් බොහොමයක් මුද්‍රානාට්‍ය නිර්මාණය කළ අතර, එයින් කොටසක් ඉගෝර් ස්ට්‍රාවින්ස්කිගේ අන්තගාමී වශයෙන්ම නවීන සංගිතය සමඟින් වන ඔහුගේ සම්බන්ධතාවය හේතුවෙන් බිහිවූ ඒවාය. ඒවාට ඔහු වඩාත් ආදරය කළ ඇගෝන් (Agon), රුබීස් (Rubies), සිම්පනි ඉන් ත්‍රී මූව්මන්ට්ස් (Symphony in Three Movements), සහ ඩියෝ කන්සර්ටන්ට් (Duo Concertant) යනාදිය ඇතුළත් වේ. බොහොමයක නිෂ්පාදන මූලාවයවයන් අවම වේ; නර්තනකරුවන් නිරන්තරයෙන්ම සරල කළු සහ සුදු නර්තන ඇඳුම් ඇඳ සිටිති. බැලන්චින්ගේ චලනයන් එහි සංගීතය, චලනය සහ අවකාශමය නිමැවුම, අලංකාරය සහ මනුෂ්‍යත්වය හේතුවෙන් ප්‍රශංසාවට ලක් කළ හැකිය.

(Jerome Robbins) ගෞරවාදරයට පත් වූ අමරිකානු බ්‍රෝඩ්වේ නර්තන රචකයෙක් වන ජෙරම් රොබින්ස් 1949 දී එන්වයිසීබී (NYCB) හි සහාය අධ්‍යක්ෂ බවට පත්වූ අතර, විචිත්‍ර මුද්‍රානාට්‍ය රසාස්වාදය සහිත නිරන්තරයෙන්ම ආදරයට පාත්‍රවූ ෆැන්සි ෆ්‍රී (Fancy Free), ආෆ්ටර්නූන් ඔෆ් අ ෆෝන් (Afternoon of a Faun), සහ වෙස්ට් සයිඩ් ස්ටෝරි සුයිට් West Side Story Suite) වැනි මුද්‍රානාට්‍ය බොහොමයක් නිර්මාණය කරන ලදී. බැලන්චීන්ගේ මරණයෙන් පසුව ඔහු සහ ඩෙන්මාර්කයේ උපත ලද (සහ හිටපු ප්‍රධාන නර්තනශිල්පී) (Peter Martins) පීටර් මාර්ටින්ස් සම සෞන්දර්ය අධ්‍යක්ෂවරුන් වූ අතර, 1990 සමාගමෙහි ප්‍රධානියා බවට පත් වූ මාර්ටින්ස් කැල්සියම් ලයිට් නයිට් (Calcium Light Night) වැනි විවිධ මුද්‍රානාටක එන්වයිසීබී (NYCB) වෙනුවෙන් නිර්මාණය කර ඇත. එන්වයිසිබී (NYCB) හි ප්‍රසාංගික එකතුවෙහි අරටුව සම්භාව්‍ය වාග් සම්ප්‍රදායේ නව නිර්මාණ වලින් නිර්මිත වූවක් වූ අතර, 1992 වසරේ සිට එන්වයිසිබී (NYCB) හි ඩයමන්ඩ් ව්‍යාපෘතිය (NYCB's Diamond Project) සහ නිව්යෝර්ක් නාට්‍ය නිර්මාණ ආයතනය; නිව්යෝර්ක් කොරොග්‍රෆික් ඉන්ස්ට්ටියුට් (New York Choreographic Institute) නිර්මාණාත්මක

ක්‍රියාවලියෙහි සමකාලීන මුද්‍රානාට්‍ය රචකයින් විශාල සංඛ්‍යාවක් සඳහා සහාය ලබාදී ඔවුන්ට බලය පවරා දී ඇත. පසුගිය දශකය තුළ ක්‍රිස්ටෝෆර් වීල්ඩන් (Christopher Wheeldon) (කැරෝසල් (Carousel), ආෆ්ටර් ද රේන් (After the Rain) සහ නිව්යෝර්ක් වෙත (Alexei Ratmansky) යාමට පෙර බෝල්ෂොයි (Bolshoi) පවත්වාගෙන යන ලද (කොන්සර්ටෝ ඩීඑස්සීඑච් (Concerto DSCH), නාමෝනා (Namouna); සහ වර්තමානයේදී ඒබීටීහි (ABT) නේවාසික කලාශිල්පී) ඇලෙක්සි රත්මාන්ස්කි, බෙන්ජමින් මිලිපිඩ් (Benjamin Millepied) (එල්ඒ ඩාන්ස් ප්‍රොජෙක්ට් (LA Dance Project) ආරම්භ කරන ලද සහ පැරිස් ඔපෙරා බැලට්හි කලා අධ්‍යක්ෂ වීමේ අවස්ථාව ඇති) සහ මෑතකාලයේ දි එන්වයිසීබී (NYCB) (Justin Peck) ඒකල ගායක ජස්ටින් පෙක් වැනි පුද්ගලයින් බිහිවීම දැක ගත හැකිය.

එන්වයිසීබී (NYCB) වෙත පවත්නා සම්බන්ධතා සළකුණු කරනු ලබන එක්සත් ජනපදයේ පිහිටි කීර්තිමත් සංවිධාන

* ඩාන්ස් තියටර් ඔෆ් හාර්ලම් (Dance Theater of Harlem) (නිව්යෝර්ක්) 1969 වර්ෂයේදී ආතර් මිචෙල් විසින් ආරම්භ කරන ලදී. (විරාමයකින් පසු එය වර්ජිනියා ජොන්සන් යටතේ මෑතකදී නැවත පිහිටුවන ලදී)
* මියාමි සිටි බැලට් (Miami City Ballet) එඩ්වඩ් විලේල්ලා විසින් 1985 දී ආරම්භ කරන ලදුව දැනට හිටපු එන්වයිසීබී (NYCB) ප්‍රධාන නර්තන ශිල්පී ලෝඩ්ස් ලෝපස් විසින් මෙහෙයවනු ලබයි. ඇය මෝපෝසස්හි අධ්‍යක්ෂවරියද වේ.
* සුසාන් ෆැරල් බැලට් (Suzanne Farrell Ballet) (වොෂින්ටන් ඩීසී) 2001 සිට බැලන්චීන්ගේ ජනප්‍රවාදගත කාව්‍ය ශාස්ත්‍රයට අධිපති දෙව්දුවක් වන මුද්‍රා නළඟන විසින් මෙහෙයවන්නකි.
* පැසිෆික් නෝර්ත්වෙස්ට් බැලට් (Pacific Northwest Ballet) (සියැටල්), ෆ්‍රැන්සියා රසල් සහ කෙන්ට් ස්ටෝවෙල් ගේ දිගුකාලීන නිලකාලයෙන් පසු පීටර් බෝල් විසින් භාරගෙන වර්තමානයේ දි ඔහු යටතේ පවතින අතර, එහි පවත්නා ප්‍රසාංගික එකතුව මෙන්ම කැපී පෙනෙන ශිල්ප ක්‍රමයන් හේතුවෙන් ගෞරවාදරයට පත්වූවකි.
* වේල් ඉන්ටර්නැෂනල් ඩාන්ස් ෆෙස්ටිවල් (Vail International Dance Festival), ඩැමියන් වෝට්සෙල් විසින් සංවිධානය කරන ලදුව, එහිදි විවිධ සමාගම් වලින් සහ ප්‍රභේදයන්ගෙන් පැමිණි කලාශිල්පින් අතර ප්‍රයෝජනවත් සහයෝගීතාවයන් ක්‍රමයෙන් ගොඩ නැගේ.

## ඇමරිකන් බැලට් තියටර් (AMERICAN BALLET THEATRE)

ඇමරිකන් බැලට් තියටර් (American Ballet Theatre) නව නිර්මාණ සහ සම්භාව්‍ය ශාස්ත්‍රයන්හි ප්‍රභවයක් ලෙස 1940 දී ඇරඹුනද, කතාන්දර පවසනු ලබන මූලික නාට්‍යමය මුද්‍රානාටක ඉදිරිපත් කිරීම පිණිස විකසනය වී ඇත. එහි ප්‍රසාංගික එකතුවෙන් විශාල කොටසක්; ස්වෝන් ලේක් (Swan Lake), රෝමියෝ ඇන්ඩ් ජුලියට් (Romeo & Juliet), ජිසෙලී (Giselle) සහ ලා බෙයාඩර් (La Bayadère). වැනි ශ්‍රේෂ්ඨ සම්භාව්‍ය කථන මුද්‍රානාටකයන් සමන්විත වේ. එයට අමතරව, ප්‍රසාංගික එකතුව වෙනුවෙන් දායක වි ඇති විශිෂ්ඨ කටහඬින් යුත් නාට්‍ය රචකයින් වන ඇග්නස් ද මිලේ, ඇන්තනි ටියුඩර්, ෆෙඩ්රික් ඇෂ්ටන්, ට්වයිලා තාප් සහ මාර්ක් මොරිස් (Agnes de Mille, Anthony Tudor, Frederick Ashton, Twyla Tharp, Mark Morris) ඇතුළත් වේ. ආර්ටිස්ට් ඉන් රෙසිඩන්ස් ඇලෙක්සි රත්මාන්ස්කි (Artist in Residence Alexei Ratmansky) මෑතකාලිනව ඒබීටී (ABT) සම්බන්ධ අර්ථාන්විත මුද්‍රානාටක නිර්මාණය කර ඇති අතර, ඒ අතරට 2012 එහි මංගල දර්ශනයේ පටන් බීඒඑම් (BAM) හි රඟ දක්වන ලද ද නට්ක්‍රැකර් (The Nutcracker) හි නව නිෂ්පාදනය සහ දිමිත්‍රි ෂොස්ටාකෝවිෂ්ගේ අපකීර්තිමත් ද බ්‍රයිට් ස්ට්‍රීම්හි (The Bright Stream) සහ ද ෂොස්ටාකෝවිෂ් ට්‍රිලජි (Shostakovich Trilogy) හි පුනර්වනය ඇතුළත් වේ. සමහරක් කණ්ඩායම් සමාගමේ ඔනාසිස් ස්කූල් (Onassis School) හි දී පුහුණු කරනු ලබන අතර, එහි බොහොමයක් ආදිකර්තෘන් විදේශ රටවලින් බිහිවූ තාරකාවන් වේ. (මෙය බොහොමයක් දෙනා ස්කූල් ඔෆ් ඇමරිකන් බැලට් හරහා බිහිවූ එන්වයිසිබි (NYCB) සමගින් අසමානතාවයන් දක්වයි). රුසියානු මුද්‍රානාටක තාරකාවක් වන මික්හේල් බේරිෂින්කෝව් ඒබීටී (ABT) දශකයක් පුරා පවත්වාගෙන යන ලදී; අමරිකන් කෙවින් මැකන්සි 1992 වසරේ සිට කලා අධ්‍යක්ෂවරාය විය.

## ප්‍රබල ස්වාධීන හඬවල් (ස්ට්‍රොන්ග් ඉන්ඩිපෙන්ඩන්ට් වොයිසස්) (STRONG INDEPENDENT VOICES)

සමහරක් දක්ෂ මුද්‍රා නාට්‍ය රචකයින් අඛණ්ඩව පවත්වා ගන යනු ලබන සමාගම් අතර දෝලනය වෙමින් නිදහස් පදනමින් කොමිස් පදනමක් මත ව්‍යාපෘතින්වල ක්‍රියා කරමින් සිටිති . ට්වයිලා තාප් ඇගේ සමාගම (Twyla Tharp) 1965 ආරම්භ කරන ලදුව, එයින් ඇගේ නවෝත්පාදන ලිහිල්, ජෑස් තූර්ය වාදන අන්තර්ගත නිර්මාණ රඟ දැක්වූ අතර, ශිල්පීය වශයෙන් අභියෝගාත්මක මුද්‍රානාටක දක්ෂ ලෙස නිර්මාණය කිරීමේදී විශිෂ්ඨත්වය දැක්වීය. ඇය බ්‍රෝඩ්වේ (මූවින් අවුට්/Movin' Out) සහ චිත්‍රපට ද ඇතුළත්ව නර්තන ප්‍රභේදයන් බොහෝමයකදී ඉහළින් සාර්ථක වූ අතර බේරිෂින්කොව් සමගින් පුෂ් කම්ස් ටු ෂෝව් (Push Comes to Shove) සහ අනිකුත් නර්තන වල 1970 -80 කාලයේදී හිටපු මර්ස් කනින්හැම් නර්තන ශිල්පී කැරොල් ආමිටේජ් (Karole Armitage) රොක් ඇන්ඩ් රෝල් සංගීතයට සැකසූ “පන්ක් බැලට්” රචනා කළේය. ඇගේ විශිෂ්ඨ හඬ බ්‍රෝඩ්වේහි සහ ඇගේම සමාගම වන ඉතාලියේ

ඇගේ කාර්යය නිම කිරීමෙන් පසු ආපසු පැමිණ 2006 නිව්යෝර්ක්හි දී නැවත සකස් කරනලද ආමිටේජ් ගෝන්හි (Armitage Gone!) දක්නට ලැබේ.

සමගම් සහ ප්‍රවණතාවයන්

එක්සත් ජනපදයේ ඇති අනිකුත් සැලකියයුතු සමාගම්

- සැන් ෆ්‍රැන්සිස්කෝ බැලට් (San Francisco Ballet) 1985 වසරේ සිට කලා අධ්‍යක්ෂ වූ හෙල්ජි ටොමැසන් විශේෂයෙන්ම නේවාසික නර්තන රචකයින් වන මාර්ක් මොරිස් සහ යූරි පොසෝකෝව් විසින් රචිත සම්භාව්‍ය කෘති සහ සමකාලීන නිර්මාණ ඇතුළත් කිරීම පිණිස ප්‍රකීර්ණක ප්‍රසාංගික එකතුවක් ගොඩ නගා ඇත.
- බැලට් හිස්පැනිකෝ (Ballet Hispanico) නිව්යෝර්ක්හි ටිනා රමියර් විසින් ආරම්භ කරන ලදුව ඇනබෙල් ලෝපස් ඔකෝයා (Anabelle Lopez Ochoa) වැනි කතාකරනු ලබන රටවලට අයත් කලාශිල්පීන්ගේ නර්තන රචනයන් කෙරෙහි අවධාරණය කරනු ලබයි.
- ජොෆ්රි බැලට් (Joffrey Ballet) 1956 වසරේ රොබට් ජොෆ්රි විසින් ආරම්භ කරන ලදුව දැනට චිකාගෝ පාදක කොට පවතී. ඔහු ඩෙන්මාර්ක ඔගස්ට් බෝනන්විල් ශෛලිය (Denmark's August Bournonville) එක්සත් ජනපදය සඳහා හඳුන්වාදුන් අතර, නිර්මාණාත්මක කාර්යයන්ට අමතරව, ඩයගිලේව් (Diaghilev) යුගයේ මුද්‍රානාටක නැවත පන ගන්වන ලදී.
- හුස්ටන් බැලට් (Houston Ballet) බොහෝ සමකාලීන කලාශිල්පීන් විසින් ප්‍රසාංගික එකතුව රඟදැක්වීමට අමතරව නොයෙක් මුද්‍රානාටක රචනයෙහි යෙදුනු ස්ටැන්ටන් වෙල්ච් විසින් ආරම්භ කරන ලදී.
- ඇස්පන් සැන්ටා ෆී බැලට් (Aspen Santa Fe Ballet) නවෝත්පාදන ව්‍යාපාර ආදර්ශයක් සහිත, ද්විත්ව නිවාස පදනමක් සහ පුළුල් පරාසයක ජනප්‍රිය ප්‍රසාංගික එකතුවකි.
- සෙඩාර් ලේක් කන්ටෙම්පරරි බැලට් (Cedar Lake Contemporary Ballet) දශකයක් තුළ ජාත්‍යන්තර මට්ටමේ කීර්තිමත් කලාශිල්පීන් විසින් සමකාලීන මුද්‍රා නාටකයන්හි සිත්ගන්නා සුළු වරණයක් සඳහා බලය පැවරී ඇති හෝ ග්‍රහණය කරගෙන ඇති නිව්යෝර්ක්හි පිහිටි ආයතනයකි.
- ඇලන්සෝ කින් ලයින්ස් බැලට් (Alonzo King Lines Ballet) සැන් ප්‍රැන්සිස්කෝ හි පිහිටි මූලිකවම කින්ග්ස් හි මලල ක්‍රීඩකයින් සඳහා වන නවීන මුද්‍රානාටක.
- බොස්ටන් බැලට් (Boston Ballet) සම්භාව්‍ය කෘතීන්ගේ සිට සමකාලීන ප්‍රසාංගික එකතුව දක්වා; ජෝමා එලෝ යනු නේවාසික නාට්‍ය රචකයෙකි.
- මෝෆසීස් (Morphoses) මූලිකව ක්‍රිස්ටෝෆර් වීල්ඩන්ගේ මුද්‍රා නාට්‍ය රචනය වටා ගොඩ නැගුනු නමුත් මෑතකාලීන වර්ෂයන්හි දී වාර්ෂික නේවාසික කලාශිල්පියෙකුගේ ලක්ෂණ පෙන්නුම් කරයි.
- හබාඩ් ස්ට්‍රීට් ඩාන්ස් චිකාගෝ (Hubbard Street Dance Chicago) මෑතකාලීනව සමකාලීන මුද්‍රානාටකය ද ඇතුළත්ව සාරසංග්‍රාහක ප්‍රසාංගික එකතුවක් බවට වෙනස් වී ඇත; ඇලජැන්ඩ්‍රෝ සෙරුඩෝ (Alejandro Cerrudo) යනු නේවාසික නර්තන රචකයෙක් වන අතර, හිටපු ජොෆ්රි බැලට් (Joffrey Ballet0 ප්‍රධානී ග්ලෙන් එඩ්ජර්ටන් (Glenn Edgerton) කලා අධ්‍යක්ෂවරයා වේ.
- පෙනින්සිල්වේනියා බැලට් (Pennsylvania Ballet) බැලන්චීන් ප්‍රෝටීජ් බාබරා වෙයිස්බර්ගර් විසින් 1963 ස්ථාපිත කරනලදී. ප්‍රමුඛ අධ්‍යක්ෂ රෝයි කෙයිසර් යටතේ සමාගම එහි බැලන්චීන් පාදක ප්‍රසාංගික එකතුව පුළුල්කර ඇත.
- වොෂින්ටන් බැලට් (Washington Ballet) ජනප්‍රවාදගත මුද්‍රානාටක ආචාර්ය මේරි ඩේ විසින් 1944 දී ආරම්භ කරන ලදුව, දැනට සෙප්ටිම් වෙබර්ගේ කලා අධ්‍යක්ෂණය යටතේ පවතී.

එක් නාට්‍ය රචකයෙකුගේ (අති අද්‍යතන ප්‍රවේශයක් සහිත පැම් ටානෝවිට්ස් ඩාන්ස් (Pam Tanowitz Dance) නිර්මාණ සම්බන්ධයෙන් හෝ ඉතා කුඩා ප්‍රමාණයේ හෝ සංක්ෂිප්ත ප්‍රසාංගික එකතුව (ටියුඩර් විසින් රචිත සම්භාව්‍ය නිර්මාණයන් නැවත පනගන්වනු ලබන ඩයනා බෙයර් විසින් ආරම්භ කරනු ලැබූ සහ නිරතුරුවම ප්‍රමාණයෙන් කෙටි නව කතාංග මුද්‍රානාටක නිර්මාණය පිණිස පවරනු ලබන නිව්යෝර්ක් තියටර් බැලට් (New York Theatre Ballet) කෙරෙහි අවධානය යොමු කරනු ලබන මුද්‍රානාටක බොහොමයක් නිව්යෝර්ක්හි දී මෑතකාලීනව ඇතිවී තිබේ. බැලට් කලෙක්ටිව් (Ballet Collective) එන්වයිසීබී (NYCB) හි ට්‍රොයි ස්කුමේචර් විසින් ආරම්භ කරන ලද නර්තන කලා සංගීත සහ කාව්‍ය ශාස්ත්‍රයේ සහකරණයක්; ඒබීටී (ABT) හි මිචෙල් විල්ස් විසින් ආරම්භ කරන ලද බැලට් නෙක්ස්ට් (Ballet Next); සහ සමකාලීන ප්‍රසාංගික එකතුව රඟ දක්වනු ලබන ජුඩිත් ෆියුගේට් සහ මේධි බාහිරි විසින් ආරම්භ කරන ලද බැලට් එන්වයි (Ballet NY), සහ හිටපු පෙනින්සිල්වේනියා බැලට් ප්‍රධානීන් වන ක්‍රිස්ටීන් කොක්ස් සහ මැතිව් නීනාන් විසින් ආරම්භ කරන ලද බැලට් එක්ස් (Ballet X) අනිකුත් ඒවා අතරට ඇතුලත් වේ.

අමරිකානු මුද්‍රානාටකයන්හි ශක්තිමත් පෙළපත විදේශ මූලයන්ගෙන් ආරම්භ වූ නමුත්, එහි ශක්තිමත් නූතන ප්‍රසාංගික එකතුව සහ සියළුම ජාතීන්ට අයත් නර්තන රචකයන්ගේ විවිධත්වය මෙන්ම ආභාෂයෙන් ලද කුසලතාවය සමගින් එය නර්තන ඉතිහාසය තුළ ස්ව තහවුරුකිරීමක් සිදුකර ඇත.

BAM

## පරිශීලන ග්රන්ථ


ඇම්බර්ග්, ජෝර්ජ්. බැලට් ඉන් ඇමරිකා (අමරිකාවේ මුද්රානාටකය): ද එමර්ජන්ස් ඔෆ් ඇන් ඇමරිකන් ආර්ට්. ඇමරිකානු කලාශිල්පයේ නිර්ගමනය). ඇම්බර්ග් ප්රෙස්, 2007 (1923).
Amberg, George. *Ballet in America: The Emergence of an American Art*. Amberg Press, 2007 (1923).

හෝමන්ස්, ජෙනිෆර්. ඇපලෝ’ස් ඒන්ජල්ස්: අ හිස්ටොරි ඔෆ් බැලට් (මුද්රානාටකයේ ඉතිහාසය). ග්රැන්ටා බුක්ස්, 2010
Homans, Jennifer. *Apollo’s Angels: A History of Ballet*. Granta Books, 2010.

ජොවිට්, ඩෙබෝරා. ජෙරම් රොබින්ස්: හිස් ලයිෆ් (ඔහුගේ ජීවිතය), හිස් ටීවර් (ඔහුගේ ගුරුවරයා) හිස් ඩාන්ස් (ඔහුගේ නර්තනය), නිව් යෝර්ක් සිමන් ඇන්ඩ් ස්කූස්ටර්, 2004
Jowitt, Deborah. *Jerome Robbins: His Life, His Theater, His Dance.* New York, Simon & Schuster, 2004.

මේනාඩ්, ඔල්ගා. ද ඇමරිකන් බැලට් (අමරිකානු මුද්රානාටකය). ෆිලැඩෙල්ෆියා: මැක්රේ ස්මිත් කම්පනි, 1959.
Maynard, Olga. *The American Ballet. Philadelphia: Macrae Smith Company,* 1959.

රෙනෝල්ඩ්ස්, නැන්සි. රෙපෝටරි ඉන් රිවීව් (ප්රසාංගික එකතුවෙහි සමාලෝචනය): ෆෝටි ඉයර්ස් ඔෆ් නිව් යෝර්ක් සිටි බැලට්. (නිව් යෝර්ක් මුද්රානාටකයේ හතලිස් වසරක්) ඩයල් ප්රෙස්, 1977.
Reynolds, Nancy. Repertory in Review: 40 years of the New York City Ballet. Dial Press, 1977.